# සාර්ථක ගෘහ ජීවිතයකට බුදු සමයෙන් උපදෙස්

හියදල ජිනවංශ හිමි - ත්‍රිපිටකවේදී උපාධි අපේක්ෂක

ගෘහ ජීවිතයක් ඉතාමත් සාර්ථක අන්දමින් පවත්වාගෙන යාම සඳහා ඒ ගෘහය හෙවත් නිවස නමැති කුඩා ඒකකය තුළ තිබිය යුතු පැවතුම් ලෙස සමගිය, සංවරය, සදාචාරය හෙවත් යහපත් චයර්‍යාව, ආදරය, කරුණාව වැනි ගුණාංග සඳහන් කළ හැකිය. මනුස්ස ජීවිතය සාර්ථක කරගැනීමෙහිලා ප්‍රධාන කරුණක් ලෙස විවාහය සඳහන් කළ හැකිය. විවාහය යනු ජීවිතයේ සන්ධිස්ථානයකි. මේ තත්ත්වයට ඊමට පෙර තවත් අවධි කීපයක් ගත කළ යුතුය. එය මෙසේ සඳහන් කල හැකිය. දෙමාපියන් යටතේ සිට හොඳ නරක දේ ඉගෙනගන්නා කාලය කුඩා අවධිය සේ සැලකිය හැකිය. ඉන් පසු අධ්‍යාපනය ලබන කාලය ගුරුවරුන් යටතේ සිටින වැදගත් අවධිය සේ සැලකිය හැකිය. ඉන්පසු එලඹෙන්නේ තරුණ අවධියයි. අධ්‍යාපන කටයුතු අවසන් කිරීමත් සමගම මේ යුගය උදා වේ. මෙහිදී දෙමාපියන් සතු යුතුකමක් වන විවාහයක් කරදීමේ අවස්ථාවයි. මේ අවස්ථාවේදී ඒ විවාහ ජීවිතයට ඇතුළත් වීමට සිටින පුද්ගලයා සිටිය යුත්තේ තමා කාන්තාවක් ආවාහ කර ගන්නේ දාසියක් වශයෙන් තබා ගැනීමට නොව තමාගේ කටයුතුවලට සහාය දක්වන කෙනෙක් ලෙසටය. දාසියක් සේ සිතා කටයුතු කරන්නට ගියොත් ඒ විවාහ ජීවිතය අඬදබර කල කෝලාහලවලින් පිරී පවතින අතර වැඩි කලක් නොගොස් විවාහය බිඳෙන්නට පවා ඉඩ තිබේ. මේ අනුව බලන විට විවාහයට පෙර බුදු දහමට අනුව තම ජීවිතය සකස් කරගත යුතුය. එසේ කටයුතු කොට ආරම්භ කරන විවාහ ජීවිතය කිසි දිනෙක බිඳෙන්නේ නැත. අඬ දබර කල කෝලාහල නැත. සාමය, සංවරය, සදාචාරය, ආදරය, කරුණාව වැනි ගුණ ධර්ම දියුණු වේ. එවිට එම පවුල හෙවත් කුඩා ඒකකය තුළින් රටටත්, සමාජයටත් යහපතක් සැලසීමට පිළිවන්කම තිබේ. ඒ කුඩා පවුල තුළින් ඇතිවන දරු පරපුරද සමාජයට ඉදිරිපත් වන්නේ යහපත් සංවරශීලී පිරිසක් වශයෙනි. මෙසේ කුඩා ඒකක රාශියක් එකතු වූ සමාජයෙන් රටටත් ජනතාවටත් විශාල සේවයක් සැලසීමට පිළිවන.

මෙහිදී විශෙෂයෙන් බලපාන්නේ කුඩා දරුවන්ට, දෙමාපියන්ගේ යහපත් පැවැත්මයි. දෙමාපියන් තුළින් ඒ කුඩා දරුවන්ට යහපත් ආදර්ශයක් ලැබෙන්නේ නම් ඒ කුඩා දරුවන්ද තරුණ වියට පත්වන විට ඒ අයගෙන්ද සමාජයට යහපතක් සැලසේ. මෙහිදී ස්වාමියන් භාර්යාවන් තුළ නිතැතින්ම පැවතිය යුතු ගුණධර්ම වන්නේ ඉවසීම, කරුණාව, දයාව, අනුකම්පාව හා සංවරයයි. මෙහිදී ඒ පවුලේ පැවැත්ම, දියුණුව සඳහා ස්වාමියාත් බිරිඳත් අතර සුහදත්වය පැවතිය යුතුය. මේ සුහදත්වය පැවතීම සඳහා බුදුන් වහන්සේ විසින් ගිහි විනය හෙවත් සිගාලෝවාද සූත්‍රයේදී පැහැදිලිව කරුණු ඉදිරිපත් කර තිබේ. ස්වාමියාගෙන් බිරිඳට ඉටුවිය යුතු යුතුකම් පහක්ද බිරිඳගෙන් ස්වාමියාට ඉටුවිය යුතු යුතුකම් පහක්ද දක්වා ඇත. මෙසේ ඒ දෙදෙනා අතර යුතුකම් ඉටුවන විට ඒ නිවස තුළ සාමය, සතුට, ආදරය, කරුණාව වැනි උතුම් ගුණ ධර්ම වර්ධනය වේ. මෙහිදී මුලින්ම සවාමියා ගෙන් භාර්යාවට ඉටුවිය යුතු යුතුකම් දැක්වීම වැදගත්ය. එසේ ස්වාමියාගෙන් බිරිඳට කරුණු පහකින් සංග්‍රහ කළ යුතුය.

1. සවාමියා විසින් ආදර වචනයෙන් ඇමතීම.
2. නරක වචන කීමෙන් අවමන් නොකිරීම.
3. පරදාර සේවනයෙහි නොයෙදීම.
4. ඓශ්වර්යය පවරා දීම.
5. ආභරණ සම්පාදනය කොට පවරා දීම යනුවෙනි.

මෙසේ ස්වාමියා විසින් බිරිඳට සංග්‍රහ කිරීමෙන් පසු බිරිඳගෙන් ස්වාමියාට කරුණු 5 කින් සංග්‍රහ කළ යුතුය. ඒ කරුණු 5 මෙසේ දැක්විය හැකිය.

i. ආහාර පිසීම් ආදී කටයුතු නොඉක්මවා කිරීම.
ii. ස්වාමි පුරුෂයාගේ පිරිවර ජනයාට සංග්‍රහ කිරීම.
iii පරපුරුෂ සේවනයෙහි නොයෙදීම.
iv. ස්වාමි පුරුෂයාගේ ධනය ආරක්ෂා කිරීම.
v. කැඳබත් ආදිය පිසින විට අනලස්ව දක්ෂවීම.

යනුවෙනි.

මෙලෙස දෙදෙනා අතර යුතුකම් හා වගකීම් නිසි ලෙස ඉටුවන විට එම නිවස තුළ සදාචාරය, සංවර්ධනය, සමගිය, වර්ධනය වේ. දූ දරුවෝ ද ඒ මාර්ගයෙහි ගමන් කරති. ඒසේ කරුණුවලින් දෙදෙනා අතර සුහදතාවය වර්ධනය වූ පසු තමන්ගේ දෙමාපිය ඥාතීන්ටද යහපත් අන්දමින් උපස්ථාන කළ යුතුය. ඒ බව සිගාලෝවාද සූත්‍රයේදී මෙසේ දක්වා තිබේ.

1. මවුපිය පෝෂණය කිරීම.
2. මවුපියන්ගේ කටයුතු කිරීම.
3. මවුපියන්ගේ කුල වංශය රැකීම.
4. දායාද පිළිපැදීම.
5. මියගිය පසු පිං දීම. වශයෙනි.

1. මවුපිය පෝෂණය :- මෙහිදී මව්පියන් පෝෂණය කිරීම යනුවෙන් දැක් වෙන්නේ දෙමාපියන්, නෑදෑයින්, මහලු වයසට පත්වූ විට කුඩා දරුවකු සේ සලකා අත්පා සෝදා කවා පොවා ආදී කටයුතුවලින් උවටැන් කිරීම සඳහන් කළ හැකිය.

2. මව්පියන්ගේ කටයුතු කිරීම :- මව්පියන්ගේ කටයුතු කිරීම වශයෙන් මෙහිදී දැක්විය හැක්කේ දෙමාපියන් වෙත පැවරෙන සියලු කටයුතු තමා විසින් ඉටුකිරීමයි.

3. මව්පියන්ගේ කුලවංශය රැකීම :- කුලවංශය රැකීම වශයෙන් දැක්විය හැක්කේ මව්පියන් නෑදෑයින් සන්තක වස්තුව ආරක්ෂා කිරීමත් ඒ අය ධාර්මික කටයුතු සඳහා යොමුවී නැත්නම් ඒ අංශයට යොමු කිරීමත්ය.

4. දායාද පිළිපැදීම :- දායාද පිළිපැදීම යනුවෙන් අදහස් කරන්නේ දෙමාපියන්ගේ අවවාද අනුශාසනා අනුව ඒ වස්තුව ආරක්ෂා කිරීම දැක්විය හැක.

5. මියගිය පසු පිං දීම :- දෙමාපියන්, ඥාතීන් මිය පරලොව ගිය පසු ඒ අය සිහිපත් කොට දන්, පින්කම් ආදී යහපත් ක්‍රියාවන් කොට පින් දීම යන කරුණු දැක්විය හැකිය.

මේ ලෙසට දූ දරුවන් විසින් දෙමව්පිය නෑදෑ හැමට උවටැන් කළ පසු දෙමාපියන් විසින් දූවාදරුවන්ට කරුණු පහකින් සංග්‍රහ කළ යුතුය. ඒ මෙසේය.

i. පාපයෙන් වැළකීම.

ii. කුසල කර්මයන්හි යෙදීම.

iii. ශිල්ප ඉගැන්වීම.

iv. සුදුසු ස්ත්‍රියක හා විවාහ කර දීම.

v. සුදුසු කළ දායාද පවරාදීම වශයෙනි.

i. පාපයෙන් වැළැක්වීම :- මෙහිදී බලාපොරොත්තු වන්නේ ප්‍රාණඝාත ආදී අකුසල කර්මවලින් මුදවාගෙන සුචරිත අංශයෙහි වැදගත්කම පහදා දීම අදහස් කල හැකිය.

ii. කුසල කර්මයන්හි යෙදීම :- යහපත් කටයුතුවලට යොමු කරවීම.

iii. ශිල්ප ඉගැන්වීම :- මෙහිදී විශේෂයෙන් අදහස් කර තිබෙන්නේ කුලපරම්පරාවෙන් පැවත එන ශිල්ප ක්‍රම පැවැත එන ශිල්ප ක්‍රම පැවැත්වීමයි. වර්තමානයේ හැටියට බැලුවහොත් නිදහස් අධ්‍යාපනය වෙත යොමුකරවීම දැක්විය හැකිය.

iv. සුදුසු ස්ත්‍රියක හා විවාහ කරදීම :- මෙහිදී සැලකිය යුත්තේ කුලයෙන් හා ශීලයෙන් යහපත් චරිතයක් ඇති සුදුසු ගුණයෙන් යුතු කාන්තාවන් තම පුතුට ආවාහ කර දීම අදහස් කළ හැකිය.

v. සුදුසු කළ දායාද පවරා දීම :- මෙසේ දෙමාපියන්ගේ, ඥාතීන්ගේ අවවාද අනුශාසනා මත දූ දරුවන් කටයුතු කරන විට තම වස්තු ඒ අය කෙරෙහි පවරා දීමයි. මෙය ඉතාමත් වැදගත් අංශයක් සේ සැලකිය හැකිය. දූ දරුවන් දෙමාපියන්ගෙන් හා ඥාතීන්ගෙන් ඈත්වන ප්‍රධාන කරුණක් ලෙස වර්තමානයේද පවතින්නේ සම සේ වස්තුව පවරා නොදීමයි. වස්තුව සමසේ බෙදා දුන් විට ඒ අය දෙමාපියන්ට හා ඥාතීන්ට පුදුම විදිහේ ගෞරවයකින් හා කරුණාබර හැඟීමෙන් කටයුතු කරණු පෙනේ.

මීළඟට භාර්‍යාවගේ විශේෂ අවධානය යොමු විය යුත්තේ ස්වාමි පුරුෂයාගේ සමාජ ආශ්‍රය ගැන බව සඳහන් කිරීම සුදුසුය. ස්වාමියා තම තමන්ට නොගැළපෙන අසත්පුරුෂ මිතුරන් ආශ්‍රය කරමින් තම වස්තුව පවා විනාශයට පත් කර ගනී. එවැනි අසත්පුරුෂ මිතුරන්ගෙන් ඉවත් කරගෙන කල්‍යාණ මිතුරන්ගේ ඇසුර ලබා දීමට කටයුතු කළ යුතුය. මෙහිදී අසත්පුරුෂයන් සතර දෙනෙක් සිගාලෝවාද සූත්‍රයේදී බුදුරජාණන් වහන්සේ දක්වා තිබේ. එනම් :-

i. අඤ්ඤදත්ථු හර

ii. වචී පරම

iii. අනුප්පිය භාණී

iv. අපාය සහය. යනුවෙනි.

මේ ලෙස දැක්වෙන අසත් පුරුෂයන්ගෙන් තම ස්වාමියා නිදහස් කරගෙන කල්‍යාණ මිත්‍රයන්ගේ අවවාදයත් ආදර්ශයත්, සහයෝගයත් ලබා දීමට කටයුතු කළයුතුය. එවැනි කල්‍යාණ මිත්‍රයන් සතර දෙනෙකි. එනම්,

i. මනා සිත් ඇත්තාවූ කළ උපකාර දන්නා වූ උපකාරක මිත්‍රයාද.

ii. සමාන සිත් ඇති දුක සැප දෙක දැනගෙන කටයුතු කරණ සමාන සුඛ දුඛ මිත්‍රයාද,

iii. මනා සිත් ඇති යහපතට නියම කරුණු කියනසුලු අත්තක්ඛායි මිත්‍රයාද

iv. මනා සිත් ඇත්තාවූ හිතවත්වූ අනුකම්පා කරන අනුකම්පක මිත්‍රයාද,

යන සිවු දෙනා යහපත් මිතුරන් සේ දැක්විය හැකිය. මෙසේ බිරිඳ ස්වාමියා පිළිබඳ නිතර නිතර සොයා බැලීම නිසා තම ධනය ආරක්‍ෂා සහිත වේ. එසේ ආරක්‍ෂා කර ගන්නාවූ ධනය පරිභෝජනය කළ යුතු ආකාරය බිරිඳ විසින් දත යුතුය. උපයන ධනයෙහි පමණ දැනගෙන අය වැය සමව පවත්වාගෙන යා යුතුය. උපයන ධනයට වඩා වැය වීම අධික වුවහොත් එහි දී ධනය උපයන තැනැත්තා පුදුම විදිහේ අසහනයකට ගැටළුවකට පත්වන බව කීමට පිළිවන.උපයනධනයමදි නම්දෙදෙනා අතර පවතින සුහදත්වය පවා විනාශ විය හැකිය. මේ නිසා බිරිඳ මේ පිළිබඳව මනා අවබෝධයකින් කටයුතු කළ යුතුය. මෙහිදී බුදුරජාණන් වහන්සේ සිගාලක ගෘහපති පුත්‍රයාට ධනය පරිභෝජනය කළ යුතු අයුරු දක්වා තිබෙන ආකාරය ඉතා වැදගත් වේ.

එකේන භොගෙ භුඤ්ජෙය්‍ය
ද්විහි කම්මං පයෝජයේ
චතුත්ථං ච නිධාපෙය්‍ය
ආපදාසු භවිස්සති.

මෙයින් පැහැදිලි කරන්නේ තම ධනය කොටස් 4 කට බෙදා පරිභෝජනයට ගත යුතු ආකාරයයි. පළමු කොටස කෑම බීම, ඇඳුම් පැලඳුම් ආදිය සඳහාද දෙවන තුන්වන කොටස් දෙක කර්මාන්ත කටයුතු කිරීමටද හතරවන (4) කොටස හදිසි ආපදාවක් සිදුවූ විටක ගැනීම සඳහා තැන්පත් කර තැබීමත්ය. මෙහිදී භාර්යාව මෙන්ම ස්වාමියාද අවබෝධයකින් කටයුතු කිරීම ඉතාමත් වැදගත් වේ.

මීළඟට භාර්යාවගේ තවත් කාර්යයක් වන්නේ වටපිටාවේ ජීවත් වන පිරිස සමග අන්‍යොන්‍ය සුහදත්වයකින් කටයුතු කිරීමයි. ස්වාමි පුරුෂයා නිතරම රැකියාවේ කටයුතු කරන අතර ස්වාමි පුරුෂයාට වටපිටාවේ ජීවත්වන ජනතාව සමග ඉතාමත් ලඟින් ඇසුරු කිරීමටත් කථාබහ කිරීමටත් අවස්ථාවක් නොලැබේ. කාන්තාව නිතරම වාගේ තම නිවසේ වැඩකටයුතු කරමින් සිටින නිසා වටපිටාවේ ජීවත්වන පිරිස සමග සුහදව කටයුතු කළයුතුය. මේ නිසා කාන්තාව මේ කාරණයේදී මුල්වී ක්‍රියා කළ යුතුය. තවත් කරුණකදී බිරිඳගේ හික්මීම පිළිබඳවද ප්‍රශ්නයක් මතු වේ. මෙහිදී කාන්තාවන්ගේ හික්මීම ප්‍රධාන කරුණක්ව පවතී. එසේ සඳහන් කරන්නේ ස්වාමියා සමහර අවස්ථාවලදී නොයෙක් ප්‍රශ්න මුල් කරගෙන භාර්යාවට දොස් පවරන අවස්ථා දකින්නට අසන්නට ලැබේ. මේ අවස්ථාවේදී කාන්තාවද නොහික්මී සිටිය හොත් දෙදෙනා අතර කලකෝලාහලයක් ඇතිවීමටද පිළිවන. ඒ නිසා කාන්තාවගේ සංවරය හික්වීම ගෘහ ජීවිතයේදී අත්‍යවශ්‍ය කරුණක්ව පවතී. කාන්තාවගේ කථාව පවා හික්මීමකින් යුතුව පැවතිය යුතුය. සවාමි පුරුෂයාට දූ දරුවන්ට කථා කරන විටද සංවරය, හික්මීම පැවතිය යුතුය. එවිට සියලු දෙනාගේම හිත දිනාගෙන ක්‍රියා කිරීමට පුලුවන. මෙසේ කාන්තාව සංවර ශීලීව කටයුතු කරන අතර සවාමි පුරුෂයා ආගමික පැත්තට යොමු කිරීමටද කාන්තාවට පැවරෙන තවත් යුතුකමකි. සවාමි පුරුෂයා ආගමික පැත්තෙන් ඈත් වී ඇත්නම් ඒ අංශයට යොමු කල යුතුය. දෙදෙනාම විවේක අවස්ථාවලදී විහාරස්ථානයන් කරා ගොස් භික්‍ෂූන් වහන්සේලාගේ අවවාද අනුශාසනා ලබාගැනීමට මල් පහන් බෝධිපූජා ආදී ආමිෂ පූජාවන්ට වීකෙන් ටික යොමු කිරීමටත් උත්සාහ ගත යුතුය. නිතර නිතර ඒ අංශයට යොමු කළ විට ස්වාමි පුරුෂයාද ඒ අංශය දියුණු කර ගැනීමට උත්සාහ ගනියි. එසේ ජීවත්වන විට දෙදෙනාම අතර සමගිය සුහදත්වය වර්ධනය වේ. සංවරය, සදාචාරය වැනි ගුණධර්ම තම තමන්ගේ ජීවිත තුළට ගෙන නියම බෞද්ධයකු සේ ක්‍රියා කරයි. එසේ කිරීමේදී ඒ නිවස නමැති කුඩා ඒකකය මගින් සමාජයට යහපත් ආදර්ශයක් ඉදිරිපත් කරයි. සමාජයේ අඩදබර කලකෝලාහල අඩුවී යහපත් සමාජයක් ගොඩනැගීමට ඒ මගින් ඉඩකඩ සැලසේ.

මේ අනුව බලන විට ගෘහ ජීවිතයක් සාර්ථක කර ගැනීමට කාන්තාවන්ගෙන් සිදුවිය යුතු සේවය කොතරම් ද යන්න මෙයින් පැහැදිලි වේ.